පවතින ආණ්ඩුව අතුරුදහන් කිරීම්වලට සැලසුම් සහගතව මැදිහත් වෙනව

ශ්‍රීලාල් ප්‍රියන්තගේ "අරුම පුදුම රහස්" පොත එක හුස්මට කියවන්න හිතෙන පොතක්. විශාල ආන්දෝලනයක් ඇති කළ හැකි රහස් ගණනාවක් ගැන තොරතුරු එළි කිරීමෙන් ප්‍රියන්ත කර ඇත්තේ ජීවිතය පරදුවට තබා කළ ගමනක්. දේශපාලන වශයෙන් ඉතා වැදගත් දේවල් කාලයේ වැලි තලාවෙන් වැසී යාමට ඉඩ නොදී මේ විදියට ලියා තැබීමෙන් මාධ්‍යවේදියෙකුගේ කැපවීම ප්‍රකාශ වෙනව. මාධ්‍ය නිදහස පළමුවෙන්ම ඇති කරන්නේ අවස්ථාවාදී නොවන මාධ්‍යවේදීන් විසින්මයි. මේ ලෙසට ක්‍රියා කිරීමට කැප වෙන්නේ ටික දෙනයි. ලෝකයේ ප්‍රසිද්ධ ජනමාධ්‍යවේදියෙක් වන John Philger මේ ප්‍රසිද්ධිය හා පිළිගැනීම ලැබුවේම එඩිතරව තොරතුරු සොයා නිරවුල් විශ්ලේෂණ සහිතව එළි කිරීමෙන්. ඉක්බාල් අතාස් වැනි අයගේ වීර මාවතේ යන්නට තරුණ මාධ්‍යවේදීන් සූදානම් වීමත් සතුටක්. මෙහිදී වමට ඉතා වැදගත් වන කරුණු කිහිපයක් එළිදරව් වෙනව. එකක් නම් ගුණදාස අමරසේකර රෝහණ විජේවීර මරා දැමීමට හවුල් වූවෙක් බවයි. ඒ මිනී මැරුම ගැන ගුණදාස අමරසේකර ප්‍රසිද්ධියේ රන්ජන් විජේරත්නට "පිස්සා මරා දැම්ම" හොඳ වැඩක් හැටියට ස්තුති කිරීම ගැනත් ඇත්ත මේ පොතේ සටහන් කර තිබෙනව. මා මෙය ලියන්නේ "පැහැර ගෙන යෑම, කප්පම් ගැනීම හා වත්මන් ආණ්ඩුවේ මාධ්‍ය මර්ධනය" යන්න විශේෂයෙන් මේ මොහොතේ එළි කිරීමටයි. හුඟ දෙනෙක් අද කථා කරන්නේ කප්පම් ගැනීම සඳහා පැහැර ගැනීම් ගැනයි. ඒත් මේ අතරින් ඉහළම නැත්නම් වඩා දරුණු වන්නේ දේශපාලන අතුරුදහන් කිරීමයි. ඒ වගේම මාධ්‍යවේදීන් සත්‍යය ප්‍රකශ කිරීම උඩ බියවැද්දීම් හා මරා දැමීමයි. මෙය එදා ප්‍රේමදාස යුගයේදීයි වඩා ප්‍රචලිත වුණේ. එදා දේශපාලන වශයෙන් එල්ල වුණ මර්ධනයට නිශ්චිත ඉලක්කයක් තිබුණා. ඒ වගේම එය එක තැනක ඉඳල මෙහෙයවුණ ක්‍රියාදාමයක්. අද වෙන්නේ එක එක බලවේග තුළින් ක්‍රියාකාරී වීමයි. කප්පම් ඉහළට ආවේ ඒ නිසයි. කප්පම් ගැනීම උදෙසා පැහැර ගැනීම් දේශපාලනමය නොවේ. එදා දකුණේ දස දහස් ගණන් තරුණ තරුණියන් නාඳුනන තුවක්කුකරුවන් විසින් මරා දැමුවා. මෙයින් විශාල පිරිසක් වැටෙන්නේ අතුරුදහන් කළ අය හැටියටයි. මේ අතුරුදහන් කිරීම් දේශපාලන වශයෙන් සැක කළ කැරළිකරුවන් මරා දැමීමක්. මේ දරුණු මර්ධනය තුළ කිසිම ලෙසකට කැරල්ලට සම්බන්ධ නැති අයත් මරා දමනු ලැබුවා. අතුරුදහන් වුණා. මේ ආණ්ඩුව යටතේ එයට සමාන්තරව දෙමළ තරුණ තරුණියන් දේශපාලන සැකය උඩ අතුරුදහන් කෙරීම කරගෙන යනව. මේ මුලු ගණන හයදහසකට (6000) ආසන්න බවට තොරතුරු එළිවෙලා තියෙනව. කොළඹ හා අවට පෙදෙස්වලින් එසේ දේශපාලන අතුරුදහන්වීම් දෙසීයක පමණ තොරතුරු ලැබිල තියෙනව. නමුත් අනෙක් පෙදෙස් සියල්ල ගත්තහම 600 ක් පමණ අතුරුදහන් වෙලා. මීට අමතරව කප්පම් ලබාගැනීම් සියයකට ආසන්න ප්‍රමාණයක් ඇති වී තිබෙන්න පුළුවන්. මාධ්‍යවේදීන් ඝාතනය කිරීම් දූසිම් ගණනකට නැගලා. මේ මාධ්‍යවේදීන් මරා දැමීම රට පුරා සිදු වෙලා. වැඩියෙන්ම යාපනයේ. ඉක්බාල් අතාස්ට එල්ල වන තර්ජනය දන් ලොම ප්‍රශ්නය වෙලා.

මේ පැහැරගෙන යෑම් පොලිස්, හමුදා දූෂිත නිළධාරීන් විසින් කරන දේවල් පමණක්ද? මේ ප්‍රශ්නය ගැන ප්‍රියන්ත සොයා බලන්නේ නැති වුණත් මෙයට අවශ්‍ය සාධක පොත තුළ එළි කරලා තියෙනව. තමාගේ පුද්ගලික ලාභය සඳහා මේ විදියට මිනිසුන් පැහැර ගැනීම් කරන දූෂිත නිළධාරීන් සිටියත් ප්‍රශ්නය එතැනින් අවසාන වෙන්නේ නැහැ. පවතින ආණ්ඩුව තමන්ගේ දේශපාලන

උවමනාව උඩ විශාල ලෙස අතුරුදහන් කිරීම්වලට සැලසුම් සහගතව එදා මෙන්ම දැනුත් මැදිහත් වෙනව. එදා සිංහල කැරලිකරුවන් තෙත් ගුණයක් නැතිව මරා දැමූ යූ.ඇන්.පී. පාලකයින් අද දෙමළ කැරලිකරුවන් මරා දැමීම ගැන මහා කම්පාවට පත් වෙලා. එසේම අද අතුරුදහන්වීම්වලට වගකිව යුතු මහින්ද රාජපක්ෂ එදා 60,000 ක් තරුණයින්න් මරා දැමීම ගැන රනිල් වික්‍රමසිංහලාට දොස් පැවරුවා. මේක තමයි පාලකයින්ගේ සාතන ගේම් එක.

අනෙක් අතට කප්පම් ගැනීම්, දේශපාලනයක් සඳහාද? සමහර පුද්ගලික කප්පම් කෙළි සිදු වුණත් මෙවැනි විශාල මුදල්වලින් කොටසක් දේශපාලන මර්ධනය සඳහා යොදා ගන්න රහස් හමුදා කණ්ඩ පවත්වගෙන යාම සඳහා යොදන බවට සැකයක් නෑ. අතීත කාලයේදී ඉඳලම මර්ධකයන් කළේ තම මර්ධන යන්ත්‍රය නඩත්තුව මංකොල්ලයෙන්ම සොයා ගැනීමයි. අදත් එයම සිදුවන බව ඉතාම පැහැදිලිව පෙනෙනවා. මේ නිසාම දේශපාලන නායකයින්ගේ අනුදැනුම ඇතිව සිදුවන කප්පම් ගැනීම් ගැනත් අපට අවධාරණය කරන්න වෙනව. මාධ්‍ය මර්ධනයේදීත් පුද්ගලිකව එල්ල වන මර්ධනයකට අමතරව දේශපාලන මර්ධනය ඉතාම ප්‍රබල තැනකට අද පත්වෙලා. පුද්ගලික බලවතුන් මාධ්‍යයට හිරිහැර කිරීම බලාපොරොත්තු විය යුත්තක්. ඒත් දේශපාලන මර්ධනයට කොහෙත්ම ඉඩ දිය යුතු නැහැ.